# බුදුබව දෙන්නට ලක්ස අසූවයි!

## කවි කොළය

බුදුහාමුදුරුවො මුල්ලක රන්දා
සායි බබා උස් අසුනක ඉන්දා
ගයපු බජන් ගී මාල පළන්දා
නෑසෙයි දැන් ඔහු මියගිය හින්දා

සිද්ධිර් බාබගෙ පුනරව තාරේ
සායි නමින් බිහිවිය මෙම වාරේ
යළි මෙලොවට එනවලු සංසාරේ
මැරි මැරි උපදින එකය විකාරේ

දෙව්මය බලයක් හිස මත දැරුවා
පණ ඇද ඇද සිටි අය සුව කෙරුවා
මළමිනි වලටත් පණ දුන් විරුවා
මිය ගිය එක නම් ඉවසනු බැරුවා

සාටක ඇත්තොද කොළ අලි ඇත්තු
ඉම්බලු දුවගොස් ඔහුගෙ සපත්තු
සායි නමින් දැන් මේ බලවත්තු
මැටි පානක්වත් නොකරති පත්තු

o o o o o o o o o o o o

පුරවන්නට මළ සායිගෙ අඩුව
ඉම්පෝටඩ් කළ අළුත්ම බඩුව
පුපුරා ගොස් ඇත අද කුඩු කුඩුව
උසාවියේ පවතී මේ නඩුව

බුදු බණ යයි කියමින් නව තාලේ
ආගම විකුණන් කති අද කාලේ
පැටලී මෝහය නම් පඹ ගාලේ
දිව යති මේ අය යන්නන් වාලේ

හන්ඩ්‍රඩ් තවුසන් මුල් මග පලයට
එමෙන් දෙගුණයකි ඊළඟ තලයට
බවුන් වඩන්නට ගොස් මහ කැළයට
වද දෙන්නේ ඇයි සිරුරට මොළයට

ලක්ස අසූවක් දී බුදු වන්නට
හරකෙක් ගිය බව ලැබුණි අහන්නට
අනාගාමි අරහත් පල ගන්නට
නොදනිමි කීයක් ඕනැද දෙන්නට

මග පල ලත් විට සහතිකයක් දෙයි
මළ පසු පෙට්ටියටත් එය වැද් දෙයි
ආදාහනයෙදි එය ගිනි බත් වෙයි
මේවා කිව්වම හුඟකට රිද් දෙයි

ජපානයෙන් ගෙන
ආ මේ පිල්ලුව
නිවන් දකින්නට
දෙනවලු තල්ලුව
මිනිසුනි මග පල
මුදලට ඉල්ලුව
උපදි තොපි එන
භවයෙ වවුල්ලුව!



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka



# කොල්ලුපිටියේ Members Only පන්සල

**කො**ළඹ කොල්ලුපිටියේ ලිබර්ටි ප්ලාසා (Liberty Plaza) වෙළඳ සංකීර්ණයේ එක් මහලක කාලයක් තිස්සේ පවත්වාගෙන ගිය අමුතුම මාදිලියේ ජපන් පන්සලක් බොහෝ දෙනා ගෙන් ආ පැමිණිළි මත මේ නොබෝදා වසා දමා සීල් තබා එය පවත්වාගෙන ගිය අයට විරුද්ධව මුදල් වංචා රැවටිලි චෝදනා මත නඩු පවරා ඇත. පන්සල යන නමින් හඳුන්වන මෙම ස්ථානය පවත්වාගෙන යන්නේ ජපන් ජාතික කාන්තාවක් ඇගේ ස්වාමි පුරුෂයා ශ්‍රීලංකා නීතිඥවරියක් හා ඇගේ දියණියත් යන සිව් දෙනා එකතුවය.

ජපන් ක්‍රමයට නිර්වාණය අවබෝධ කරගැන්ම සාමාන්‍ය ක්‍රමයට වඩා පහසු බවත් එයට අවශ්‍ය වන්නේ මහායාන දහමේ එන මහා සද්ධම්ම පුණ්ඩරීක සූත්‍රයේ එන එක් ගාථා පාඨයක් දහස්වර එක දිගට සජ්ජායනා කිරීම පමණක් බවත් මේ ස්ථානයෙන් කියා දෙන දෙයයි. සෝවාන් සකෘදා ගාමි අනාගාමි ආදී මාර්ග පල ද මෙහිදී ලබාගත හැකි ය.

එහෙත් මේ කිසිවක් නොමිළයේ ලැබෙන දේ නොවේ. ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණ ගෙවිය යුතු වන්නේය. රුපියල් සීය දෙසීය නොව, රුපියල් දහස් ගණන් හෝ ලක්ෂ ගණනිනි.

මේ තැන සාමාජිකත්වය සඳහා රුපියල් 7000 ක් බැඳිය යුතුය. මෙතැනට ආයුත්තේ ඒ සාමාජිකයෙකුගේ මාර්ගයෙන් පමණය. සමහරුන්ගේ මුලු පවුලම මෙහි සාමාජිකත්වය ලබා ඇත. එපමණක් නොව ඇතැම් අය තම ගෙවල් ඉඩ කඩම් පවා මෙතැනට පවරා ඇති බව කියති. සමහරු බුදුබව පතා ලක්ෂ විස්ස තිහ මෙතැනට ගෙවා ඇති බව පැවසේ. මේ සියල්ල විහිලු ජවනිකා ලෙස කෙනෙකුට සිතෙන්නට පුළුවන. එහෙත් මෙය විහිළුවක් නොවේ. ලංකාවේ අපේ ජනතාව මෙපමණ මෝඩද කියා හිතාගන්නටවත් බැරිය.

මෙම ස්ථානය ගැන නොයෙක් පැමිණිළි ආවත් එය ඉහළ තැන්වල කාගේවත් කනට වැටුණේ නැත. බෞද්ධ භික්ෂූන් වහන්සේලා කීප දෙනෙක් හා ගිහියන් ද ඇතුළුව පිරිසක් මෙතැනට ගොස් විරෝධය පෑ විට ඒ පන්සල පවත්වාගෙන යන නීතිඥවරිය පොලීසිය කැඳවා පිරිස විසුරුවා හරින ලදී. පොලීසියද පන්සල ආරක්ෂා කරන්නට උත්සාහ ගන්නා බවක් පෙනීගොස් ඇත. මේ පන්සලට කොළඹ සල්ලිකාරයින් කීප දෙනෙකුගේද දේශපාලනයට සම්බන්ධ අයගේද අනුග්‍රහය ලැබෙන බව ද කියති.

ජනතාව රවටා මුදල් ගරණ මෙවැනි තැන් දැන් ලංකාව පුරාම බිහිවී ඇත. මේ උතුම් දහමක් විකෘති කර විකුණාගෙන කෑමකි.

# There Are Now More Obese People than Hungry People in the World

# ලොව වැඩියම ඉන්නේ මහත අයයි



## BBC News

There are now more overweight people across the world than hungry ones, according to experts.

US professor Barry Popkin said all countries - both rich and poor - had failed to address the obesity boom. He said the number of overweight people had topped 1bn, compared with 800m undernourished. Speaking at an Australian conference, he said changing diets and people doing less physical exercise was the cause. He said the "burden of obesity", with its related illnesses, was also shifting from the rich to the poor, not only in urban but in rural areas around the world.

There were 1.5billion dangerously overweight people worldwide last year, while 925million were underfed, according to the Red Cross.

More people in the world are now dying from obesity than malnutrition, anti-poverty campaigners say.

**ක**ලින් පිළිගත් මතය වූයේ ලොව කුස ගින්නෙන් පෙළෙන දිළින්දන්ගේ සංඛ්‍යාව වැඩිය කියාය. එහෙත් දැන් විශේෂඥයින් කියන්නේ එහි අනෙක් පැත්තය. එනම් මුළු ලොව ජනගහනයෙන් බහුතරය කෑම වැඩිකම නිසා අධික ලෙස මහත් වී සිටින අය බවයි. ගණන් බලා ඇති විදියට ලොව තරබාරු අය බිලියන 1 ටත් වඩා සිටිති. ආහාර හිඟයෙන් කෙට්ටුව සිටින අය මිලියන 800 කි.

ඇමරිකානු මහාචාර්ය බැරී පොප්කින් පවසන්නේ මෙම වැඩිවන තරබාරුකම මර්දනය කිරීමට පොහොසත් රටවල් හා දිළිඳු රටවල් දෙකොටසම කිසිදු පියවරක් ගෙන නැති බවයි. මෙය දැන් නගරයට පමණක් නොව මෙතෙක් සනීපාරක්ෂාව වැඩියයි සිතූ ගම්බදට පවා බෝවී ඇති තත්වයකි. මේද තෙල් හා සීනි අධික සෞඛ්‍යට අහිතකර කෑම වර්ග ගන්නට දැන් ලොව වැඩි දෙනා පුරුදුව සිටීමත් ඔවුන්ගේ ශරීරවලට අවශ්‍ය ව්‍යායාම නොමැතිවීමත් ස්ථූල භාවයට ප්‍රධාන හේතූන් බව පෙන්නා දී ඇත. තරබාරුකම නිසා අකාලයේ මිය යන ගණන වැඩි වී තිබේ.



**ඉරිදා - SUN** හුඟ කාලෙකට පස්සෙ තලවකැලේ නැන්දම්මට කතා කළා. නැන්දම්මා හෝමගම ඇවිල්ලා. සුවර්ණට තුන්වෙනි දරුව හම්බවෙලා, ඒ සාත්තුවට ආවයි කිව්වා. තලවකැලේ තියන නැන්දම්මලගෙ හෝටලේ දැන් මාතර කට්ටියකට බද්දට දීලා. විල්බට් මාමත් මැරුණයින් පස්සෙ දැන් ඒවා බලලා කරන්න කෙනෙක් නැත කිව්වා. බාල දුව නිමල්කා (සායි) බැඳලා ඉතාලියට ගිහිල්ලා. එයාගෙ හස්බන්ඩ් එහේ වැඩ කරනව කිව්වා. නිමල්කට අපි කිව්වෙ සායි කියලා. එයාට පොඩිකාලෙ සායිබබාට වගේ බොකුටු කොණ්ඩයක් තිබුණා. අවුරුදු ගණනකින් මම සායි දැකලා නැහැ. ඉස්සර මම ඉස්කෝලෙ නිවාඩුවට තලවකැලේ යනවා. මාසෙම වගේ එහේ ඉන්නවා. වටේටම තේ වතු. කන්ද උඩ තිබුණේ තේ පැක්ටේරියයි, ඊට පහළින් හේමචන්ද්‍ර සහෝදරයින්ගේ බංගලාව. ඒ සේරම දැන් හීනයක්. සුන්දර හීනයක්. . . .

**සඳුදා - MON** තිලකසිරිලගෙ ලංකාවෙ මිනීපෙට්ටි සාප්පුවෙ මැනේජර් ලන්ඩන් ඇවිත් ඉන්නවා එම්බාම් කෝස් එකක් කරන්න. පෙරේදා අපිට ටූටිං වලදි හම්බවුණා. එයා කියනවා මෙහේ මිනී සාප්පුවක එක සුද්දෙක් එම්බාම් කරන්න යන වියදමෙන් ලංකාවෙ විසිපහක් එම්බාම් කරන්න ඇහැකිය කියලා. මොකද ලංකාවෙ දැන් බොන අරක්කුවල හැටියට කෙනෙක් මැරුණාම එම්බාම් බෙහෙත් ඕන නැත, අර ඊජිප්තුවෙ පිරමිඩ්වල වගේ මිනිය අව්රුදු දහස් ගණනක් වුනත් තියාගන්න ඇහැකිය කියලා. බලන්න ඉතිං අපේ අය කොච්චර අනාගතේ ගැන හිතලා කටයුතු කරනවද කියලා. නේද?

**කුජදා - TUE** නන්දනී ඊයෙ අපේ ගෙදර ආපු වෙලාවෙ හවස බීබීසී නිවුස් යනවා. ලෝකෙ දැන් මහත මිනිස්සු එන්න එන්නම වැඩිවෙනවයි කියලා නිවුස් වලට කිව්වම, හිනාවුණා එයා ඔය කියන නිවුස් ඒ තරම් ගණන් ගන්නෙ නැත කියලා. එයාගෙ සමරු පොතේ කවුද යාලුවෙක් ඒ කාලෙ ලිව්වලු Fat people are happy people කියලා. ඒක තවම එයා විස්වාස කරනවලු. තේ එකක් හදන්න ගිහිං, මම ඇහුවම සීනි කීයක්ද කියලා, මගේ නෑනේ ඔය ගණන් හිලව් දාන්න තුනක් හතරක් කියලා කිව්වා. මම මුකුත් නොකිය හැඳි තුනක් දැම්මා. ලංකාවෙ එයා හදවන අළුත් ගේ ගැන කතාකළා. යන්න ලෑස්ති වෙලා සැටියෙන් නැගිට්ටෙ ඇන්දට අත තියලා හරි අමාරුවෙන්. මට පවු කියලා හිතුණා. කෙනෙකුට ඕන දෙයක් දෙන්න පුළුවන්. මොළේ දෙන්න බෑ.....

**බුදදා - WED** අද උදේ පාන්දර 4 ට ඇහැඇරිලා මම ඇඳ ළඟ තියන මගේ පුංචි රේඩියෝ එක ඇහෙන නෑහෙන ගානට දාගෙන බීබීසී නිවුස් ඇහුවා. අපේ එක්කෙනා ගොරව ගොරව නිදි. නිවුස් වලට කිව්වා ඇමරිකාවෙ දැනට පදිංචිවෙලා ඉන්න මුස්ලිම් කට්ටියක් ඔබාමා රජයට විරුද්ධව නඩුවක් දාන්න යනවලු, බින් ලාඩන් මැරුවටයි, මිනිය වයිෆ්ට දුන්නෙ නැතුවටයි. ඒ ගොල්ල බිනාගෙ නෑදෑයොලු. වැඩේ හරි ගියත් නැතත් ඒ මිනිස්සු කරන්න යන දේවල තේරුමක් තියනවා. හැම ගෑනියෙකුටම අයිතියක් තියනවා තමන්ගෙ මිනිහගෙ මිනිය තමන් කැමති විදියට අවසාන කටයුතුකරන්න. හොඳ මිනිහෙක් වුනත් අමු අපරාධකාරයෙක් වුනත් මැරුණම ඒ මිනිය පවුලෙ අය ගෙන්නලා පෙන්නන්න ඕන. එහෙම පෙන්නන්නෙ නැතුව මිනිය හොර රහසෙම මූදට විසි කෙරුවා. කෝ මේ හියුමන් රයිට්කාරයො? එකෙක් කටක් ඇරියෙ නෑ ඇමරිකාව වැරදිය කියලා.

**ගුරුදා - THU** දැන් ලංකාවෙ සිද්ධ වෙන දේවල් ගැන හිතන කොට මට ඒ කාලෙ ගාල්ලෙ ටවුමෙ තිබ්බව පවගහ මතක් වුණා. එතන ට නානාප්‍රකාර අය ආවා. ඇවිත් රැස්වෙලා ඉන්න අයට බිම ඉරි ඇඳලා, කොටු ගහලා, කේන්දර හඳහන් ඇඳලා, සාස්තර කියනවා. තව අය විජ්ජා විත්ත පෙන්නනවා. සමහරු බෙහෙත්තෙල් විකුණනවා. ඒත් ඒ කාලෙ මිනිස්සු රැවටුණේ නෑ. මුන්ගෙ මේ බොරු නේ කියලා හිනාවෙලා යන්න යනවා. ඒත් දැන් කාලෙ ලංකාවෙ ඉන්න සිංහළ මිනිස්සු රවට්ටන්න හරි ලේසියි. ඕනම කෙරාටිකයෙකුට අහුවෙනවා. සෝමතුංග බාප්ප මේ ළඟදි එවපු ලියුමක ලියලා තිබුණා, දුවේ මුන්ගෙ පස්ස පැත්තෙ වල්ගෙ ඩිංගක් තිබුණ නම් ආයි දෙකක් නෑ කරත්තෙ බඳින්න ගන්න පුළුවන් කියලා.

**කිවිදා - FRI** ලංකාවෙ අළුත්ම ගසාකෑම තමයි රහත්වෙන එර්දියෙන් අහසෙන් යන සෝවාන් පල ලැබෙන ටියුෂන් පංති දාලා තියනවා. ඒවයින් පාස් වුනාම සැටිපිකේට් දෙනවා. ගාස්තුව තමයි වැඩි. රුපියල් ලක්ෂ දහයක් වෙනවා. පාස්වුනාම සැටිපිකේට් එකත් අරන් ගෙදර යන්නෙ එර්දියෙන් ලු. සෑහෙන පිරිසක් ලක්ෂ ගණන් වියදම් කරලා තියනවා. එතනට ළඟදි පොලීසියෙන් සීල් තියලා. ඇයි කියලා ඇහුවම පොලීසියෙ ලොක්කා කිව්වලු මේ විදියට රහත් වෙන්න ගියොත් තව අවුරුද් දක් යනකොට ලංකාවෙ කවුරුවත්ම නැතිවේවි කියන බයටයි වහලා දැම්මෙ කියලා. මිනිස්සු බඳින්න ගෙනාපු සල්ලිත් අරන් පොලීසියට බැණ බැණ ආපහු ගියාලු.